දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය - රුහුණ විශ්වවිද්‍යාලය
Distance and Continuing Education Unit – University of Ruhuna

මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය - Faculty of Humanities & Social Sciences

ප්‍රථම ශාස්ත්‍ර (බාහිර) 2018 පරීක්ෂණය (2015 පුනර්) - 2018 සැප්තැම්බර්/ඔක්තෝබර්
First Examination in Arts (External) 2018 (Repeat 2015) – September/October 2018

සවිප්‍ර 1.2 - දකුණු ආසියාව තුළ ශ්‍රී ලංකා සමාජය
SGY 1.2 – Sri Lankan Society in South Asia

කාලය පැය තුන යි

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න
නො පැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු වීමට ඉඩ ඇත

---

01. i. සංස්කෘතිය යනු කුමක්දැයි නිර්වචනය කර එය සමන්විත වන සංරචකයන් මොනවාදැයි සැකෙවින් දක්වන්න.
(ලකුණු 04)

ii. එම සංරචකයන්ගෙන් ඕනෑම දෙකක් තෝරාගෙන දකුණු ආසියානු සංස්කෘතිය සම්බන්ධව එම සංරචකයන් හි අන්තර්ගත සුවිශේෂ ලක්ෂණ මොනවාදැයි පැහැදිලි කරන්න.
(ලකුණු 06)

iii. "දකුණු ආසියානු සංස්කෘතිය වෙනස්වන විචල්‍යයක් ලෙස තේරුම් ගත යුත්තකි" මෙම ප්‍රකාශයට ඔබ එකඟ වන්නේ ද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න.
(ලකුණු 10)

02. i. ගැමි සමාජයක් යනු කුමක්දැයි නිර්වචනය කරන්න.
(ලකුණු 04)

ii. රොබර්ට් රෙඩ්ෆීල්ඩ් සහ එරික් වුල්ෆ් යන අයගේ ගැමි සමාජය පිළිබඳ විවරණයේ සම විෂමතාවන් පරීක්ෂා කරන්න.
(ලකුණු 06)

iii. ශ්‍රී ලංකාව ගැමි සමාජයක් ලෙස හඳුනාගත හැකිද යන්න නිදසුන් දෙමින් පැහැදිලි කරන්න.
(ලකුණු 10)

03. i. ආගම යනු කුමක්දැයි නිර්වචනය කරන්න.
(ලකුණු 04)

ii. දකුණු ආසියාතික ආගම්වල ඔබ දකින සුවිශේෂතාවන් කවරේදැයි පැහැදිලි කරන්න.
(ලකුණු 06)

iii. "බුදු දහමේ මෑතකාලීන වෙනස්කම්" යන මැයෙන් රචනාවක් ලියන්න.
(ලකුණු 10)

04. i. කුලය යනු කුමක්දැයි නිර්වචනය කර එහි ආරම්භය පිළිබඳව ඉදිරිපත් වී ඇති මතවාදයන් පැහැදිලි කරන්න.

(ලකුණු 04)

ii. කුල ක්‍රමය සමාජ සංවිධානයක් ලෙස ඔබ විග්‍රහ කරන්නේ කෙසේ ද?

(ලකුණු 06)

iii. දකුණු ආසියාතික කුල ක්‍රමයේ මෑත කාලීන ප්‍රවනතා මොනවා ද යන්න නිදසුන් දෙමින් සාකච්ඡා කරන්න.

(ලකුණු 10)

05. i. පවුල යනු කුමක්දැයි නිර්වචනය කරන්න.

(ලකුණු 04)

ii. G.P. මර්ඩොක් දක්වන ආකාරයට මූලික පවුලේ කෘත්‍යයන් මොනවාදැයි සැකෙවින් දක්වන්න.

(ලකුණු 06)

iii. ශ්‍රී ලාංකික පවුල් සංස්ථාව ආශ්‍රිතව සිදුවී ඇති මෑත කාලීන වෙනස්කම් මොනවා ද යන්න නිදසුන් දෙමින් පැහැදිලි කරන්න.

(ලකුණු 10)

06. i. විවාහය යන්න නිර්වචනය කර එයින් අපේක්ෂිත අරමුණු මොනවාදැයි සැකෙවින් දක්වන්න.

(ලකුණු 04)

ii. විවිධ විවාහ ප්‍රභේද/වර්ග මොනවාදැයි සඳහන් කර එම විවාහ ප්‍රභේද/වර්ග වලින් දෙකක් තෝරා ගෙන ඒවා මගින් සමාජ සංවිධානයේ පැවැත්ම සඳහා සිදු කරන මෙහෙය ප්‍රමාණය කරන්න.

(ලකුණු 06)

iii. ශ්‍රී ලංකා සමාජයේ විවාහ සංස්ථාව අවසන් වීම කෙරෙහි බලපා ඇති මෑතකාලීන සාධක නිදසුන් දෙමින් පැහැදිලි කරන්න.

(ලකුණු 10)

07. i. දකුණු ආසියාතික ජනගහනයේ ඔබ දකින සුවිශේෂතා සැකෙවින් දක්වන්න.

(ලකුණු 04)

ii. දකුණු ආසියාතික ජනගහනයේ දැකිය හැකි ගැටුම් ඔබ විග්‍රහ කරන්නේ කෙසේ ද?

(ලකුණු 06)

iii. ශ්‍රී ලංකාවේ වියපත් (වයස්ගත) ජනගහනය වර්ධනය වීමේ දී මතු වී ඇති අභියෝග යන මැයෙන් රචනාවක් ලියන්න.

(ලකුණු 10)

08. පහත මාතෘකාවලින් දෙකක් පිළිබඳව සටහන් ලියන්න.

i. සංස්කෘතිකකරණය
ii. හින්දු ජජ්මානි ක්‍රමය
iii. දෑවැද්ද
iv. ආසියාතික සමාජයේ කාන්තාව

(එක් පිළිතුරකට ලකුණු 10 බැගින්)